**බද්දේගම ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

---------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 වර්ෂයේ පෙබරවාරි 21 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 පෙබරවාරි 17 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 16 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට බද්දේගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

සමාලෝචිත වර්ෂයේ අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.6,301,262 ක දායක මුදල් ණයහිමියන් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.16,593,207 ක් වූ ගිණුම් විෂයයන් 09 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර අසමානතා වල එකතුව රු.10,425,033 ක් විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.12,161,141 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 07 ක් නිරවුල් කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) (i) දීර්ඝ කාලයක් තිස්සේ ගිණුම්වල ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.4,928,588 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 06 ක් නිරවුල් කරගෙන නොතිබුණි.

(ii) 2013 වර්ෂයටත් පෙර සිට පොදු තැන්පත් ගිණුමේ ඉදිරියට ගෙනෙමින් පවතින රු.276,585 ක් වූ වැට් බදු ශේෂය සහ රු.94,413 ක් වූ ජාතිය ගොඩ නැගීමේ බදු ශේෂය නිරවුල් කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු.15,550 ක් වූ තාර තොගය පිළිබඳ උපලේඛන ද, රු.18,394,739 ක් වූ තැන්පත් හා රු.3,042,880 ක් වූ සේවක ණය සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ හා විස්තරාත්මක තොරතුරු ද ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| **නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| **ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මු.රෙ.570 හා 571(1)(2) | 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ක කාලයක් ඉක්ම වූ එකතුව රු.2,528,212 ක වර්ග 04 කට අයත් තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මු.රෙ.1645 හා 1646 | සභාවේ වාහන 13 කට අදාළ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.18,235,414 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,784,647 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු6,450,767 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

**--------------------------------------**

ඉකුත් වර්ෂ සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ ජංගම සහ ක්ෂණික අනුපාත වල සතුටුදායක තත්ත්වයක් නොපවතින බව නිරීක්ෂණය විය.

**2.3 ආදායම් පරිපාලනය**

**----------------------**

**2.3.1 වරිපනම් හා බදු**

**------------------**

සමාලෝචිත වර්ෂය තුළ අයකර ගත යුතුව තිබුණු එකතුව රු.8,209,200 ක් වූ වරිපනම් බදු හා රු.197,656 ක් වූ වරිපනම් බදු අධි ගාස්තු බිල් කිරීම් වලින් රු.1,802,707 ක් පමණක් වර්ෂය තුළ අයකර ගැනීම නිසා වර්ෂය අවසානයට හිඟ වරිපනම් ශේෂය රු.6,604,150 ක්ව පැවතුණි.

**2.3.2 අක්කර බදු**

**------------**

වර්ෂයේ ආරම්භයට වූ රු.24,683 ක හිඟයෙන් සහ රු.18,350 ක බිල් කිරීම් වලින් රු.16,457 ක් පමණක් වර්ෂය තුළ අයකර ගැනීම නිසා වර්ෂය අවසානයට තවදුරටත් රු.26,576 ක හිඟයක් පැවතුණි.

**2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,697,711 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.33,932,314 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**--------------------------------------**

පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ.

(අ) (i) සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවැති පුරප්පාඩුව පුරවා ගැනීමටත් අතිරික්ත තනතුරු 28 ක් විධිමත් කර ගැනීමටත්, කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රාථමික කාණ්ඩයට අයත් සේවකයින් දෙදෙනෙකුට කළමනාකරණ සහකාර තනතුරේ රාජකාරි පවරා තිබුණු අතර, කම්කරුවන් දෙදෙනෙකුට රියදුරු රාජකාරි පවරා තිබුණි.

(ආ) සභාව සතු බැංකු ජංගම ගිණුම් 04 ක පැවැති මාසික සාමාන්‍ය ශේෂයන්හි එකතුව රු.3,496,860 ක් වූ නමුත්, මෙම මුදල් ආයෝජනය කර පොලී ආදායම් උපයා ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) පුස්තකාල සම්පත් වර්ධනය කිරීමේ අරමුණින් 2001 වර්ෂයේ පුස්තකාල සංවර්ධන අරමුදලෙන් ලබා දී තිබූ රු.137,774 ක් ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කර තිබුණි.

(ඈ) මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් 2015 ජූලි 10 දින නිකුත් කරන ලද රාජ්‍ය ආයතනවල අබලන් වූ වාහන භාවිතා කිරීම පිළිබඳ අංක 02/2015 දරන චක්‍රලේඛයේ 02 වන ඡේදය ප්‍රකාරව සභාව සතු ගර්හිත කැබ් රථය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ඉ) (i) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ 2014 නොවැම්බර් 27 දින මිලදී ගෙන තිබුණ ටයර් 10 ක් 2017 අප්‍රේල් 06 දින වනවිටත් ගබඩාවේ නිශ්කාර්යව පැවැතුණි.

(ii) 2009 වර්ෂයටත් පෙර මිලදී ගෙන තිබුණු මෝටරය, FM මයික්‍රෝෆෝනය හා DVD යන්ත්‍රය 2017 අප්‍රේල් 06 දින තෙක් කිසිදු ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා නොගෙන ගබඩාවේ රඳවා තිබුණි.

## 3.2 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

2014 වර්ෂයේදී සභාවට ලබා දී තිබූ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය එදින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මීටර් පැය 260 ක් පමණක් ධාවනයට යොදවාගෙන තිබූ අතර, 2016 වර්ෂයට රක්ෂණ ආවරණ ලබා ගැනීම සඳහා රු.114,642 ක් වැයකර තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

ගිනිමැල්ලගහ දොඩංගොඩ සති පොලෙහි කඩ කාමර අතර පොළොව කොන්ක්‍රීට් කිරීම හා අන්තර් සම්බන්ධිත කුට්ටි ගල් ඇතිරීමේ ව්‍යාපෘතියට උපමාන පාදක ප්‍රදාන යටතේ රු.1,000,000 ක් ලබා දී තිබූ අතර, වැඩ විෂයය අංක 03 ප්‍රකාරව කාමර අතර අඟල් 03 ඝනකමට කොන්ක්‍රීට් ඇතිරීම සඳහා රු.401,625 ක් ගෙවා තිබුණු නමුත්, නිසි පරිදි කොන්ක්‍රීට් නොයෙදීම නිසා ගල් මතු වී තිබූ අතර, මට්ටම් නොකිරීම නිසා ජලය පිරී තිබුණි.

## 3.4 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

බද්දේගම ප්‍රාදේශීය සභාව කසළ වර්ග කර ලබා ගන්නා අතර, දිරන කසළ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කර, අලෙවි කිරීම සඳහා ද, නොදිරන කසළ වර්ග අලෙවි කිරීමට ද කටයුතු කර තිබුණි. අපද්‍රව්‍ය කළමනාකරණය සාර්ථකව ක්‍රියාත්මක කර තිබුණු නමුත්, කසළ කළමනාකරණ භූමිය සඳහා පරිසර බලපත්‍රයක් ලබා ගෙන නොතිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 08 ක එකතුව රු.39,618,409 ක ඉතිරිවීම් ද, ආදායම් විෂයයන් 03 ක එකතුව රු.31,601,538 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම් ද පැවැතීම නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 4.2 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර විගණන විමසුම් මඟින් සභාවේ අවධානයට යොමු කරන ලදී. පහත විස්තර දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධතිය | | පද්ධතියේ ප්‍රධාන අඩුපාඩු |
|---|---|---|---|
| (අ) | වාහන පාලනය | (i) | සභාව සතු වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| | | (ii) | නිෂ්ක්‍රීය වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | | (iii) | දෛනික ධාවන සටහන් පත් සහ මාසික කාර්ය සාධන සාරාංශ විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |
| (ආ) | ගිණුම්කරණය | (i) | සභාව විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | | (ii) | තැන්පත් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබූ අතර, වර්ෂය අවසන් දිනට ශේෂය ඉදිරියට ගෙනවිත් නොතිබුණි. |
| | | (iii) | ණයහිමි ලේඛනය විධිමත්ව නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) | ආදායම් පාලනය | (i) | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| | | (ii) | මුද්දර ගාස්තු ආදායම් හා උසාවි දඩ ආදායම් යාවත්කාලීනව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (iii) | බැංකු ජංගම ගිණුම්වල පැවති අතිරික්ත මුදල් ආයෝජනය කර ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | සේවක මණ්ඩල කළමනාකරණය | (i) | කාර්යය මණ්ඩල පුරප්පාඩු පුරවා ගැනීමට මෙන්ම අතිරික්ත කාර්යය මණ්ඩලය විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | සභාවේ සේවය කළ නිලධාරින්ගේ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (iii) | තනතුරට අදාළ රාජකාරි පවරනු වෙනුවට සේවකයින්ට ඊට ඉහළ රාජකාරි පවරා තිබුණි. |
| (ඉ) | ණයහිමියෝ හා ණයගැතියෝ | (i) | ඉකුත් වර්ෂවල සිට පවතින වත්කම් හා බැරකම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් ශේෂ, නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. |